# යන අයට යන්න ඉඩ දෙන්න!
# Let Them Go !



There are people who can walk away from you.

When people can walk away from you, let them walk.

Don't try to talk another person into staying with you, loving you, calling you, caring about you, coming to see you, staying attached to you.

When people can walk away from you let them walk.

Your destiny is never tied to anybody that left.

People leave you because they are not joined to you.

And, if they are not joined to you, you can't make them stay.

Let them go.

And it doesn't mean that they are a bad person, it just means that their part in the story is over. And you've got to know when people's part in your story is over, so that you don't keep trying to raise the dead.

You've got to know when it's over.

Believe in " goodbye" and wish them so.

It does not mean being insensitive or uncaring on your part.

It's a fitting tribute for some one who was so close to you but now walking away from you.

Say " Goodbye" and let them go!!

ඔබෙන් වෙන්වී යන්නට යන අය සිටිය හැක. ඒ අය ඔබ හැර යන්නේ නම් ඔවුන්ට යන්න ඉඩ දෙන්න!

නොගොසින් සිටින්නට යයි ඇවිටිලි බස් කියමින් ඔබ හා වෙසෙන්නට, ඔබට ආදරය කරන්නට, ඔබ ගැන බලන්නට, නිතර ඔබ දකින්නට එන්නට හා ඔබ සමග දිගටම ඇසුරු කරන්නට යයි කියා දුක්මුසු බසින් බැගෑපත් වන්නට එපා ! ඔබ හැර යන අයට එසේ යන්නට ඉඩ දෙන්න!

ඔබේ දෛවය හෝ ඉරණම හෝ ඒ වෙන්ව යන කිසිවෙකුට බැඳ තබා නැත.

ඔවුන් නික්ම යන්නේ ඔවුන් ඔබට බැඳී නැති බැවිනි. එසේ නම් ඔවුන් තබා ගන්නට බැරිය. ඔවුන් ඔබට බැඳී නැත්නම්, ඔබ ඔවුන්ට බැඳී පවතින්නේ කෙසේද? එය තේරුම් ගන්න ඔවුන්ට යන්න ඉඩ දෙන්න !

යන්නට යන අය ඒ නිසාම නරක අය ලෙස සිතන්නට එපා! ඔවුන්ගේ යන්නේ කතාවේ ඔවුන්ගේ කොටස අවසාන නිසාය.

එසේම ඔබේ කතාන්තරයේ ඔවුන්ගේ කොටස අවසන් වන් නේ කොයි විටද යන්න ඔබ දැන සිටිය යුතුය. එවිට ඔබද මැරුණු අයට පණ දෙන්නට සිතන්නේ නැත!

අවසානය කොයි විටදැයි ඔබ දැන සිටිය යුතුය. වෙන්ව යන අයට ආයුබෝවන් කියා සුබ පතන්න!

එය ඔබේ පැත්තෙන් බැලුවහොත් කිසිසේත් අකාරුණිකවීමක් හෝ අහිතවත්මක් හෝ නොවේ. එය ඔබ හා සමීපව විසූ කෙනෙකු වෙන්ව යන විට දක්වන සැබෑ හිතවත්කමය.

ඒ නිසා වෙන්ව යන අයට ආයුබෝවන් කියා සුබ පතන්න!

ඔවුනට නික්ම යන්න ඉඩදෙන්න!

**(From a sermon given by Bishop T. D. Jakes - Texas, Ca. USA)**

♦ ***දීපා සඳමාලි හේරත්* Deepa Sandamali Herath - *Ca, USA***

## ලන්ඩනයේ ශ්‍රීලංකා මහා ක්‍රිකට් සැණකෙළිය
## Sunday 8th July 2012




## Gold found in the Kelani River

With the spreading news that there is gold mixed in the sand in Kelani river in Sri Lanka, hundreds of men, women and children now make a bee-line to the river early in the morning and begin their search for gold. They say they can earn about Rs. 2000 a day by selling the gold they collect. The owners of jewellery shops in the area say the gold found in the river was very pure with a fineness of 24 carats. The residents of the area said it was a miracle and a gift from the gods to the sand miners who had been struggling for existence and living from hand to mouth. They said their panning for gold would not cause any damage to the environment.



කැළණි ගඟ දියට බැස රත්‍රං ගරන කතුන්

## ඇත්නම් පෙර පින්කරන් ඔයත් ගිහින් රත්තරන් අරන් එන්න ඇති තරන් කැළණි ගඟෙන් රත්තරන්

පසුගිය මාසයේ හදිසියේම කැළණි ගඟේ ඇති වැලිවල රත්තරන් තිබෙන බවට ආරංචියක් පැතිරයත්ම ඒ පළාතේ සහ පිට පෙදෙස්වලින් ද දෙනෝ දාහක් ගැහැණුන්, පිරිමින් සහ ළමුන් තාච්චි, බේසම් සහ වෙනත් භාජන ගෙන දුවගෙන විත් කරවටක් ගඟට බැසැ වැලි උඩට ගෙන සෝදමින් රත්තරන් ගරන්නට පටන් ගත්හ. ඒ එසේ එකතුකරගන්නා රත්රන් ස්වර්ණාභරණ සාප්පුවලට විකුණා දිනකට රුපියල් 2000 කට වැඩි මුදලක් උපයන බවද ඔව්හු කියති. ඒ පළාතේ රන් රිදී වෙළෙන්දන් කියන අන්දමට ඒ කැළණි ගඟෙන් ලැබෙන කුඩා රත්‍රං කැබලි කැරට් 24 හොඳ පවුම් රත්රන්ය.

මෙම රත්‍රං පහළවීම කෙළින්ම දෙවි දේවතාවුන්ගේ වැඩක් බව කැළණි ගඟ අවට ජීවත්වන සමහරුන්ගේ විශ්වාසයයි. අමාරුවෙන් ජීවනෝපාය සරිකරගත් ඔවුන් දෙස දෙවියන් බලා මෙසේ රත්‍රං පහළ කළ බව සිතති. එසේම මෙම ගැරීමේදී වැලි ගොඩදැමෙන්නේ නැති බැවින් මෙයින් ගඟට කිසිදු හානියක්ද නැතැයි ද ඒ ජනතාව කියති.



## චීන පවුලක්ම සිරිලක දී පැවිදි බිමට

මැලේසියාවේ වෙසෙන චීන ජාතික පවුලක් (පියා මව සහ පුතුන් දෙදෙනා) පසුගිය දා ශ්‍රී ලංකාවට පැමිණ පැවිදි දිවියට ඇතුළත් වූහ. මැලේසියාවේ පිනැන්ග්හි මහින්දාරාමාධිපති පූජ්‍ය ඇල්ගිරියේ ඉන්ද්‍රරතන හිමියන්ගේ මග පෙන්වීම යටතේ මේ සිව්දෙන මහනුවර දී මහණ කම ලැබූහ.

එකම පවුලේ මව, පියා හා කුඩා පුතුන් දෙදෙනෙකු මෙලෙස මහණවීම මෙහි ඇති විශේෂත්වයයි.

පියා වන, වොන්ග් වෙයි - ගුණරතන හිමි නමින්ද, මව, වේ චින් -ප්‍රජාපතී දසසිල් මාතාව ලෙසින්ද, පුතුන් දෙදෙනා වන 'වයයි. වොන් යා මින් සහ වෙන් යා මින් - ධම්මරතන හිමි හා චන්දරතන හිමි නමින්ද පැවිදි දිවියට පත්වූවෝය